State Ministry of Education Reforms, Promotion of Open Universities and Distance Learning

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

G.C.E. ORDINARY LEVEL - Rehearsal Question Paper

අ.පො.ස. සා/පෙළ - පෙරහුරු ප්‍රශ්න පත්‍රය

(BUSINESS & ACCOUNTING STUDIES

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

(QUESTION PAPER) - I

ප්‍රශ්න පත්‍රය - I

අනුග්‍රහය :

NenasaTV

The National e-learning Portal for The General Education

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය - I

අ.පො.ස.(සා/පෙළ) - ආදර්ශ ප්‍රශ්න පත්‍රය

11 ශ්‍රේණිය **කාලය පැය 1 යි**

- **සැලකිය යුතුයි.**
  - **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
  - **අංක 1 සිට 40 දක්වා ප්‍රශ්නවලට දී ඇති (1),(2),(3),(4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.**
  - **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රෙය් එක් එක් ලශ්නය ස්හා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
  - **එම පිළිතුරු පත්‍රයේ පියුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා , ඒවා පිළිපදින්න.**

- පහත සිද්ධිය ඇසුරෙන් 01 සිට 03 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- සිරිමල් වසර 8 ක් පමණ ප්‍රසිද්ධ කිරි නිශ්පාදන ආයතනයක සේවය කිරීමෙන් අනතුරුව ඉන් ඉවත් වී යෝගට් නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කළේය. ප්‍රදේශයේ සිටින කිරි ගොවීන්ගෙන් කිරි මිලදීගෙන යෝගට් නිෂ්පාදනයකර ගමේ වෙළෙන්දන්ට ඒවා අලෙවි කරයි.

01. සිරිමල් විසින් සපුරාලනු ලබන අවශ්‍යතාවයක් හා වුවමනාවක් වන්නේ,
    1) ආහාර - යෝගට්
    2) යෝගට් - කිරි නිෂ්පාදන
    3) කිරි නිෂ්පාදන - ආහාර
    4) සෞඛ්‍යය - යෝගට්

02. සිද්ධියේ සඳහන් සිරිමල්ගේ යෝගට් ව්‍යාපාරය
    1) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි.
    2) සේවා සපයන ව්‍යාපාරයකි.
    3) සෘජු නිෂ්පාදන ව්‍යාපාරයකි.
    4) ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයකි.

03. සිරිමල්ගේ ව්‍යාපාරයට ශක්තියක් වන්නේ,
    1) ප්‍රාදේශීය කිරි ගොවීන් සිටීම.
    2) අවට ප්‍රදේශයේ වෙළෙඳසැල් පිහිටා තිබීම.
    3) කිරි නිෂ්පාදන ව්‍යාපාරයක රැකියාව තුළින් ලත් පළපුරුද්ද.
    4) යෝගට් සඳහා ඉල්ලුමක් පැවතීම.

- **කළුගල්** කඩා බෙදාහැරීමේ ව්‍යාපාරයක නිරත වූ **හිමිකරුවෙකු** ඉතා කාර්යක්ෂම **යන්ත්‍රයක්** පිටරටින් ගෙන්වා එය ක්‍රියා කරවීමට **දක්ෂ සේවකයන් තිදෙනෙකු** යෙදවීම.

04. ඉරි ඇඳි පදවලට අදාළ නිෂ්පාදන සාධක පිළිවෙලින් දැක්වෙන්නේ,
    1) ප්‍රාග්ධනය, ශ්‍රමය, භූමිය, ව්‍යවසාය
    2) භූමිය, ව්‍යවසාය, ප්‍රාග්ධනය, ශ්‍රමය
    3) භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය, ශ්‍රමය
    4) ව්‍යවසාය, භූමිය, ප්‍රාග්ධනය, ශ්‍රමය

05. රජය ව්‍යාපාර කෙරෙහි මැදිහත්වන ආකාර හා ඊට නිදසුන් පහත දැක්වේ.

x තීරුව	**y තීරුව**
1 හිතකර දිරිගැන්වීම් ලබා දීම	**A විදුලිය , මහා මාර්ග**
2 පාරිභෝගික ආරක්ෂාව	**B බදු සහන**
3 පරිසරය සුරැකීම	**C පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය**
4 යටිතල පහසුකම්	**D මධ්‍යම පරිසර අධිකාරිය**

ඉහත X තීරුවේ තොරතුරු y තීරුවේ තොරතුරු සමඟ ගැළපූ විට නිවැරදි පිළිතුර වනුයේ,

1) 1-C, 2-B, 3-A, 4-D
2) 1-A, 2-B, 3-C, 4-D
3) 1-B, 2-C, 3-D, 4-A
4) 1-D, 2-C, 3-B, 4-A

06. ව්‍යාපාර කෙරෙහි ඇල්ම ඇති පාර්ශවයන් ලෙස කළමනාකරුවන්ගේ අරමුණක් නොවන්නේ,

1) ව්‍යාපාර අරමුණු ඉටුකර ගැනීමට අවශ්‍ය කළමනාකරණ තීරණ ගැනීම.
2) කළමනාකරණ තීරණ ක්‍රියාත්මක කිරීම.
3) රැකියා වර්ධනය කිරීම.
4) ව්‍යාපාර අනාගතයේදී වර්ධනය කිරීම.

07. ව්‍යාපාරයට ''ව්‍යාපාර පරිසරය'' වැඩි වාසිදායක වන්නේ පහත සඳහන් කුමන අවස්ථාවලදී ද?

1) අවස්ථා හා තර්ජන ඇතිවීම.
2) ශක්තීන් හා තර්ජන ඇතිවීම.
3) ශක්තීන් හා අවස්ථා ඇතිවීම.
4) දූර්වලතා හා ශක්තීන් ඇතිවීම.

08. ව්‍යාපාර සංවිධාන කෙරෙහි බලපාන පනත් කිහිපයක් පහත දැක්වේ.

A 1890 හවුල් ආඥා පනත
B 2007 අංක 07 දරන සමාගම් පනත
C 1840 වංචා වැළැක්වීමේ ආඥා පනත
D 1972 අංක 06 දරන සමාගම් පනත

මින් හවුල් ව්‍යාපාර කෙරෙහි බලපාන පනත් වනුයේ,

1) A පමණි.
2) A , B, C පමණි,
3) A, C පමණි.
4) ඉහත සියල්ලම.

09. රාජ්‍ය සංස්ථාවල දක්නට නොලැබෙන රාජ්‍ය දෙපාර්තමේන්තුවල දක්නට ලැබෙන ලක්ෂණයක් වන්නේ,

1) අයිතිය හා පාලනය රජය සතුවීම.
2) අඛණ්ඩ පැවැත්මක් නොතිබීම
3) රජයේ මූල්‍ය රෙගුලාස්වලට යටත්වීම
4) නෛතික පුද්ගලභාවයක් තිබීම

10. විද්‍යුත් බැංකු සේවා තුළින් ඉටුකර ගත නොහැකි කාර්යයක් වන්නේ,
   1) බැංකු ගිණුමේ ශේෂය පිරික්සීම.
   2) චෙක් පොත් ලබා ගැනීම.
   3) බැංකු ගිණුම් ප්‍රකාශන ලබාගත හැකි වීම.
   4) විදුලි බිල්පත්, ජලබිල්ගත් ගෙවා දැමීම.

11. රුවන් තම ව්‍යාපාරික ගනුදෙනු පහසු කර ගැනීමේ අරමුණින් චෙක්පත් මගින් ගනුදෙනු කිරිම සඳහා ජංගම ගිණුමක් ආරම්භ කිරීමට අදහස් කළේය. ඒ සඳහා ඔහු යායුතු බැංකුව වන්නේ,
   1) ජාතික ඉතිරි කිරීමේ බැංකුව.
   2) ශ්‍රී ලංකා මහ බැංකුව.
   3) ප්‍රාදේශීය සංවර්ධන බැංකුව.
   4) සී/ස හැටන් නැෂනල් බැංකුව.

12. රක්ෂණය සම්බන්ධ කරුණු කිහිපයක් පහත දැක්වේ.

A ස්වාමි පුරුෂයාට තම නීත්‍යානුකූල භාර්යාව රක්ෂණය කළ හැකිය.
B රක්ෂණ දේපළකට වන්දි ලැබෙනුයේ හානිය යථා තත්ත්වයට පත් කිරීමට පමණි.
C රක්ෂිතයා හා රක්ෂකයා රක්ෂන ගිවිසුමට අදාල සියලු තොරතුරු හෙළිදරව් කළ යුතුය.

ඉහත කරුණුවලට අදාල රක්ෂණ මූලධර්ම පිළිවෙලින් දැක්වෙන්නේ,
   1) රක්ෂ්‍ය හිමිකම, හානිපූරණය, උපරිම විශ්වාසය.
   2) උපරිම විශ්වාසය, ආසේශකය, රක්ෂ්‍ය හිමිකම.
   3) රක්ෂන හිමිකම, උපරිම විශ්වාසය, හානිපූරණය..
   4) හානිපූරණය, උපරිම විශ්වාසය, රක්ෂන හිමිකම.

13.



ඉහත A , B, C හිස්තැනට අදාල පිළිතුර පිළිවෙලින් දැක්වෙන්නේ,
   1) පණිවිඩය, මාධ්‍යය, ප්‍රතිචාරය
   2) මාධ්‍යය, පණිවිඩය, ප්‍රතිචාරය
   3) පණිවිඩය, ප්‍රතිචාරය, මාධ්‍යය
   4) මාධ්‍යය, ප්‍රතිචාරය, පණිවිඩය

14. කළමනාකරණ කාර්යයන්ට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

A ව්‍යාපාර අරමුණු අපේක්ෂිත අයුරින් ඉටුකර ගැනීම කාර්යක්ෂමතාවය නම් වේ.
B ව්‍යාපාර අරමුණු තීරණය කර ඒවා ඉටුකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග තීරණය කිරීම සම්බන්ධ ක්‍රියාවලිය සැලසුම්කරණය ලෙස හැඳින්වේ.
C සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී මානව සම්පත් නිසිලෙස මැසිරවීමේ ක්‍රියාවලිය සංවිධානකරණය වේ.
D කටයුතු සැලසුම් කළ අයුරින් ඉටු වී දැයි සොයා බලා අඩුපාඩු නිවැරදි කිරීමේ ක්‍රියාවලිය පාලනයයි.

ඉහත තොරතුරුවල,

1) A B සත්‍ය වන අතර C D අසත්‍ය වේ.
2) A C අසත්‍ය වන අතර B D සත්‍ය වේ.
3) A D සත්‍ය වන අතර B C අසත්‍ය වේ.
4) A B C සත්‍ය වන අතර D අසත්‍ය වේ.

15. අලෙවිකරණ මිශ්‍රයේප්‍රවර්ධන විචල්‍යයට අයත් සාධක ඇතුළත් පිළිතුර නිවැරදිව දැක්වෙන්නේ,

1) ප්‍රචාරණය, ගුණත්වය. මෝස්තරය, විකුණුම් ප්‍රවර්ධනය.
2) පෞද්ගලික අලෙවිය, විකුණුම් ප්‍රවර්ධන වට්ටම්, මහජන සම්බන්ධතා.
3) විකුණුම් ප්‍රවර්ධනය, ප්‍රචාරණය, පෞද්ගලික අලෙවිය, මහජන සම්බන්ධතා.
4) ප්‍රචාරණය, ගුණත්වය, අංගෝපාංග, මෝසතරය

16. පසන් තම රැකියාවෙන් විශ්‍රාමගත් පසු ලැබූ අර්ථසාධක අරමුදල ආයෝජනයක යෙදවීමට අදහස් කරයි. මොහුගේ අපේක්ෂා පහත පරිදිය.

- ස්ථාවර පොළී ප්‍රතිශතයක් යටතේ පොළී ආදායමක් ලැබීම.
- ඕනෑම හදිසි අවස්ථාවකදී මුදල් බවට පත්කර ගැනීම.
- ආයෝජනයට සම්බන්ධව පූර්ණ ආරක්ෂාවක් ලබා ගැනීම.

පසන්ට සුදුසු ආයෝජන මාර්ගය වන්නේ,

1) කොටස් මිලට ගැනීම.
2) ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම.
3) ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කිරීම.
4) භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම

17. ව්‍යාපාරයක වත්කම් හා වගකීම් අඩුවීමට බලපාන ගනුදෙනුව තෝරන්න.

1) ණයහිමි රුවන්ට රු. 7000 ක් ගෙවීම
2) රු. 15 000 ක කාර්යාල උපකරණ ණයට ගැනීම
3) රු. 10 000 ක තොගයක් නැවත විකිණීම සඳහා ණයට ගැනීම
4) ව්‍යාපාරයට රු. 15 000 ක බැංකුණයක් ලබා ගැනීම

18. පහත ගිණුම්කරණ සමීකරණ ඇසුරින් සාවද්‍ය පිළිතුර තෝරන්න.

1) වත්කම් = වගකීම් + හිමිකම
2) වත්කම් - වගකීම් = හිමිකම
3) වත්කම් - හිමිකම = වගකීම්
4) වත්කම් = වගකීම් - හිමිකම

19. ව්‍යාපාරයක් සම්බන්ධයෙන් ගනුදෙනුවක ද්විත්ව සටහනක් පහත දැක්වේ.

දුන්වට්ටම් ගිණුම හර	100	
මුදල් ගිණුම හර	900	
තාරක ගිණුම බැර		1000

ඉහත ගනුදෙනුව නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.

1) රු. 1 000 ක වට්ටමක් යටතේ රු. 1 000 ක තොග මිලට ගැනීම
2) රු. 1 000 ක ණයගැතියෙකුගෙන් රු. 100 ක දුන් වට්ටමකට යටත්ව මුදල් ලැබීම.
3) රු. 1 000 ක භාණ්ඩ තොග ණයට විණීමේ දී රු. 100 ක වට්ටමක් ලබා දීම.
4) රු. 1 000 ක තොග ණයට ගැනීමේ දී රු. 100 ක වට්ටමක් දීම.

20. 2020/08/01 දිනට හා 2020/08/05 දින නයනාගේ ව්‍යාපාරයේ ගිණුම් සමීකරණය පහත දැක්වේ.

	වත්කම් (රු.)	=	හිමිකම් (රු.)	+	වගකීම් (රු.)
2020/08/01	50 000	=	30 000	+	20 000
2020/01/05	(4 500)	=	+ 500	+	(5 000)

ව්‍යාපාරයේ 2020/08/05 දින සිදුවී ඇති ගනුදෙනුව වන්නේ,

1) රු. 5 000 ක ණයක් ගැනීම
2) රු. 5 000 ක බැංකු ණය වාරිකය හා රුත 500 ක පොළිය සමඟින් ගෙවීම.
3) ණයහිමියෙකුට රුත 5 000 ක් ගෙවීමේ දී රු. 500 ක වට්ටමක් ලැබීම.
4) රුත 5 000 ක භාණ්ඩ රුත 500 ක වට්ටමකට යටත්ව මුදලට විකිණීද.

21. පහත සඳහන් ප්‍රකාශ අතරින් නිවැරදි ද්විත්ව සටහන් රීතිය ඇතුළත් ප්‍රකාශය තෝරන්න.

1) වත්කම්, වියදම් අඩුවීම බැර - ආදායම්, හිමිකම් , වගකීම් වැඩිවීම බැර
2) වත්කම්, වියදම් වැඩිවීම හර - ආදායම්, හිමිකම් , වගකීම් වැඩිවීම හර
3) වත්කම්, වියදම් වැඩිවීම හර - ආදායම්, හිමිකම් , වගකීම් අඩුවීම බැර
4) වත්කම්, වියදම් අඩුවීම බැර - ආදායම්, හිමිකම් , වගකීම් අඩුවීම බැර

- පහත තොරතුරු අසුරින් 22 හා 23 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගනුදෙනුව	මූලික පොත
1. රු. 4 000 ක භාණ්ඩ ණයට ගැනීම	A. විකුණුම් ජ'නලය
2. රු. 16 000 ක කාර්යාල උපකරණ ණයට ගැනීම	B. මුදල් පොත
3. රු. 17 000 ක භාණ්ඩ ණයට විකිණීම	C. ගැනුම් ජ'නලය
4. රු. 2 000 ක විදුලි බිලක් ගෙවීම	D. පොදු ජ'නලය

22. ඉහත ගන්දෙනුව හා මූලික පොත් නිවැරදිව පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,

1) 1-B, 2-D, 3-A, 4-C
2) 1-A, 2-B, 3-D, 4-C
3) 1-D, 2-C, 3-A, 4-B
4) 1-C, 2-D, 3-A, 4-B

23. ඉහත ගනුදෙනු සඳහා අවශ්‍ය මූලාශ්‍ර ලියවිලි පිළිවෙලින් නිවැරදිව දක්වා ඇති පිළිතුර කුමක්ද/

1) ජ'නල් වව්චරය, ගැනුම් ඉන්වොයිසිය, විකුණුම් ඉන්වොයිසිය, වව්චරය
2) ගැනුම් ඉන්වොයිසිය, වව්චරය, ජ'නල් වව්චරය, ලදුපත
3) ගැනුම් ඉන්වොයිසිය, ජ'නල් වව්චරය, විකුණුම් ඉන්වොයිසිය, වව්චරය
4) විකුණුම් ඉන්වොයිසිය, වව්චරය, ලදුපත, වව්චරය

- පහත තොරතුරු ඇසුරින් අංක 24 හා 25 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලහිරුගේ ව්‍යාපාරයේ 2020/08/01 සුළු මුදල්භාරකරුගේ සුළු මුදල් ශේෂය රු. 3 000 කි. අගෝස්තු මාසයේ සුළු මුදල් වියදම් ශේෂ පහත දැක්වේ.

	රු.
ලිපිද්‍රව්‍ය	1 500
ගමන් ගාස්තු	1 500
සංග්‍රහ වියදම්	2 000
විවිධ වියදම්	2 500

24. ලහිරුගේ අගෝස්තු මාසයේ සුළුමුදල් අග්‍රිමයේ වටිනාකමට රු. 15 000 දක්වා රු. 5 000 කින් වැඩි කිරීමට තීරණය කරන ලදි.
ජූලි මාසයේ සුළු මුදල් වියදම් වටිනාකම වන්නේ,
   1) රු. 5 000
   2) රු. 3 000
   3) රු. 7 000
   4) රු. 4 500

25. 2020 අගෝස්තු මාසය අවසානයේ සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කළ යුතු මුදල වන්නේ,
   1) රු. 4 500
   2) රු. 7 500
   3) රු. 12 500
   4) රු. 15 000

26. නියාස්ගේ ව්‍යාපාරයේ 2020 ජූලි මාසය සඳහා ලද බැංකු ප්‍රකාශයේ රු. 15 500 ක බැර ශේෂයක් විය.
මෙය,
   1) ව්‍යාපාරයේ වත්කමකි.
   2) ව්‍යාපාරයේ වගකීමකි.
   3) බැංකු අයිරාවකි.
   4) බැංකුවේ වත්කමකි.

27. නෙළුම්ගේ ව්‍යාපාරයේ සැප්තැම්බර්මාසයේ පොදු ජ'නලය පහත දැක්වේ.

පොදු ජ'නලය

දිනය	ජ'නල් වව්චරය	විස්තරය	හර	බැර
		.....................A........................	4 000	
		........................B.....................		4 000
		(උපචිත රක්ෂණ ගාස්තු සටහන් කිරීම)		

ඉහත A හා B ස්ථානවලට අදාල නිවැරදි යෙදුම් පිළිවෙලින් දක්වා ඇති පිළිතුර තෝරන්න.
   1) රක්ෂණ ගාස්තු ගිණුම, උපචිත රක්ෂණ ගාස්තු ගිණුම
   2) රක්ෂණ ගාස්තු ගිණුම, මුදල් ගිණුම
   3) උපචිත රක්ෂණ ගාස්තු ගිණුම, රක්ෂණ ගාස්තු ගිණුම
   4) මුදල් ගිණුම, උපචිත රක්ෂණ ගාස්තු ගිණුම

28. ව්‍යාපාරයක 2020/03/31 දින පිළියෙල කළ ශේෂ පිරික්සුමේ හර තීරුවේ එකතුව රු. 700 000 වූ අතර , බැර තීරුවේ එකතුව රු. 650 000 ක් විය. මෙම වෙනසට සිදු වී ඇති වරද වන්නේ,
    1) විකුණුම් ගිණුමේ එකතුව රු. 50 000 කින් අඩු වීම
    2) ලද වට්ටම් රු. 50 000 ලද වට්ටම් ගිණුමේ දෙවරක් සටහන් වීම.
    3) වැටුප් ගිණුමේ රු. 50 000 ක් අඩුවෙන් සටහන් වීම.
    4) ගැනුම් ගිණුමේ එකතුව රු. 50 000 කින් අඩු වීම.

29. ඉහත වරද නිවැරදි කිරීමෙන් පසු අවිනිශ්චිත ගිණුමේ ශේෂය වන්නේ,
    1) රු. 50 000 ක බැර ශේෂයකි.
    2) රු. 50 000 ක හර ශේෂයකි.
    3) ශේෂයක් නැත.
    4) රු. 100 000 ක බැර ශේෂයකි.

30. ක්‍රීඩා සමාජයක වාර්ෂික සාමාජික මුදල රු. 300 කි.
    මුළු සාමාජික සංඛ්‍යාව 400 වේ.
    10 දෙනෙකු සාමාජික මුදල් වර්ෂය තුළ ගෙවා නොමැත.

ඉහත තොරතුරු අනුව ක්‍රීඩා සමාජයේ ලැබීම් හා ගෙවීම් ගිණුමේ දැක්විය යුතු සාමාජික මුදල් වන්නේ,
    1) රු. 120 000
    2) රු. 117 000
    3) රු. 116 000
    4) රු. 123 000

31. මුඛ ආවරණ නිෂ්පාදනය කරන රවිනාත්ගේ නිෂ්පාදනයට අදාල තොරතුරු පහත දැක්වේ.

රෙදි රු. 2 800
වැටුප් රු. 5 000
කඩකාමර කුලී රු. 500
වෙනත් වියදම් රු. 1 700

නිෂ්පාදිත ඒකක ගණන 500

මෙම නිෂ්පාදිකයට අදාළ ප්‍රාථමික පිරිවැය වන්නේ,
    1) රු. 2 800
    2) රු. 7 800
    3) රු. 5 000
    4) රු. 10 000

32. ඒකකයකට 20% ලාභාන්තිකයක් ලබා ගන්නේ නම් මුළු විකුණුම් ඒකක මිල වන්නේ,
    1) රු. 2 000
    2) රු. 12 000
    3) රු. 5 000
    4) රු. 2 500

- පහත සඳහන් තොරතුරු උපයෝගි කරගෙන අංක 33 - 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

හානුගේ ව්‍යාපාරයේ 2019/12/31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුමේ තොරතුරු පහත දැක්වේ.

	රු.
ප්‍රාග්ධනය	200 000
තොගය (2019/01/01 දිනට)	20 000
විකුණුම්	150 000
ගැනුම්	80 000
ගෙනඒමේ කුලී	2 000
මෝටර් රථ	200 000
මෝටර් රථ ක්ෂය වෙන් කිරීම	60 000
ණයගැතියෝ	70 000
ණයහිමියෝ	100 000
වරිපනම් හා රක්ෂණ	55 000
බෙදාහැරීමේ වියදම්	85 000
මූල්‍ය වියදම්	5 000
ලද වට්ටම්	10 000
ලාභාංශ ආදායම්	25 000
10% බැංකු ණය	50 000
මුදල්	10 000

අතිරේක තොරතුරු

- 2019/12/31 තොගය රු. 50 000
- ණයගැතියන්ගෙන් රු. 500 ක් බොල් ණය ලෙස කපා හරින ලදි.
- ඉදිරියට ගෙවූ වරිපණම් හා රක්ෂණය රු. 5000 කි.
- බැංකු ණය පොළිය ගෙවිය යුතුය.
- මෝටර් රථ ක්ෂය 10% කි. (සරල මාර්ග ක්‍රමයට)

33. හානුගේ ව්‍යාපාරයේ දළ ලාභය වන්නේ,
    1) රු. 100 000
    2) රු. 48 000
    3) රු. 98 000
    4) රු. 50 000

34. මෙම ව්‍යාපාරයේ දැක්වෙන පරිපාලන වියදමක් හා මූල්‍ය වියදමක් දක්වා ඇති පිළිතුර වන්නේ,
    1) බැංකු ණය පොළී , වරිපණම් හා රක්ෂණය
    2) ලද වට්ටම්, බැංකුණය පොළී
    3) වරිපණම් හා රක්ෂණය, බැංකුණය පොළී
    4) ගෙන ඒමේ කුලී, බැංකුණය පොළී

35. ව්‍යාපාරයේ ආදායම් ප්‍රකාශයේ දැක්විය යුතු මූල්‍ය වියදම්වල එකතුව වන්නේ,
    1) රු. 4 000
    2) රු. 10 000
    3) රු. 6 000
    4) රු. 1 000

36. මෙම ව්‍යාපාරයේ ශුද්ධ ලාභය වන්නේ,
    1) රු. 17 500 ලාභයකි.
    2) රු. 12 500 ලාභයකි.
    3) රු. 27 500 අලාභයකි.
    4) රු. 17 500 අලාභයකි.

37. ජංගම වත්කම් හා ජංගම වගකීම් වටිනාකම් පිළිවෙලින් දැක්වෙන්නේ,
    1) රු. 134 500 , රු. 105 000 .
    2) රු. 130 000 , රු. 100 000 .
    3) රු. 70 000 , රු. 100 000 .
    4) රු. 7 000 , රු. 105 000

38. මුළු වගකීම්වල එකතුව වන්නේ,
    1) රු. 155 000
    2) රු. 160 000
    3) රු. 150 000
    4) රු. 105 000

39. මෝටර් රථවල ධාරණ වටිනාකම වන්නේ,
    1) රු. 160 000
    2) රු. 200 000
    3) රු. 120 000
    4) රු. 140 000

40. 2019/12/31 දිනට ව්‍යාපාරයේ හිමිකම වන්නේ,
    1) රු. 227 000
    2) රු. 200 000
    3) රු. 173 000
    4) රු. 212 000